# සිහිනය

ඒ. ආර්. එම්. ඕ. චලනිඳු අරමුදල

# සිහිනය

කර්තෘ - ඒ. ආර්. එම්. ඕ. චලනිඳු අරමුදල

ප්‍රථම මුද්‍රණය - 2023

ISBN - ISBN 978 624 208 132- 8

මුද්‍රණය - ගේට්වේ කොමියුනිකේෂන්
මහනුවර

# පිදුම

නිතරම මට ගුරුහරුකම්

ලබා දෙන

මාගේ ආදරණීය

අප්පච්චීට සහ අම්මාට,

# පෙරවදන

ගගනගාමියෙකු වීමේ අනාගත සිහිනය
දකින මම එහි ආරම්භයක් ලෙස
මෙම පොත රචනා කළෙමි. සැබවින් නොදුටු
ලොවක් පිළිබඳ ව ගෙතෙන මෙම කථාංගය
පාඨක රසවින්දනය උදෙසා
මෙලෙස අකුරු කොට තබමි.

# විදුහල්පතිතුමාගේ පණිවිඩය



නෙතට සොඳුරු දසුනක් සේම මනසෙහි ගොඩනැගෙන පරිකල්පනයත්, සිතට නැඟුණු ප්‍රභාශ්වර හැඟුම් පොකුරක විපුල ඵල ප්‍රතිනිෂ්පාදනය කෙරෙන්නේ ලේඛන කලාවෙනි. ලේඛනයේ අගය දන්නා, හෘදය සංවේදී පරිණත රසඥතාවයෙන් යුත් ලේඛකයා විචාර බුද්ධියෙන්, නිර්මාණ චාතුර්යයෙන්, ප්‍රතිභාවේ කූටප්‍රාප්තියෙන් ව්‍යුත්පත්තියේ සහ සතතාභ්‍යාසයේ උදාරත්වයෙන් විශ්වීය චින්තනයෙන් ගෝලීය ජය ටැඹ වෙත පිය මං තබයි.

ලේඛක කලාවේ යථාර්ථවාදී අගය වටහා නොගෙන ලේඛනය තුළ ම, මං මුලාවී අනේක විද දුර්ලක්ෂණ ප්‍රවර්ධනය වන අයුරින් ලේඛන කලාව අවභාවිතාවට ගැනීම වර්තමාන සමාජ ක්‍රමය තුළ දක්නට ලැබෙන ප්‍රකට ලක්ෂණයක් වී ඇත. සම්භාව්‍ය ලේඛන කලාවේ විපුල ඵල පිළිබඳව කල්පනා මාත්‍රයකු දූ නොමැතිව, සමාජය පන්හිදෙන් ඝාතනය කරණු වෙනුවට එය ආත්මාර්ථකාමීත්වයෙන් හා ධන තෘෂ්ණාවෙන් අවභාවිතා කරන්නෝ විරල නොවෙති.

ආත්මාර්ථය, බල ලෝභිත්වය, අදූරදර්ශීත්වය විනිර්මුක්ත සමාජ ක්‍රමයක අඩිතාලම පාසල් පද්ධතිය තුළින් යළි ඇති කළ හැකිය. ඒ සඳහා නිපුණතා පාදක අධ්‍යාපනය තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛස්ථානයක් හිමි වේ.

දම්රද පුතණුවන්ගේ භාෂා ශක්‍යතාව වර්ධනය කරමින් විචක්ෂණශීලී, ලොව ජය ගත හැකි අංකුර ලේඛකයින් දැයට දායාද කිරීමට දම්රද ලේඛක සමාජය ගන්නා උත්සාහය අතිඋත්කෘෂ්ටය. ශ්‍රී ලාංකික ජන සමාජය තුළ තම ලේඛන කෞෂල්‍යයෙන් අපූර්ව ලෙස බස හසුරවමින් සම්මානනීය වූ ලේඛන පරපුරක් දම්රදය බිහි කොට ඇත. එවැනි ලේඛන පරපුරක් උදෙසා දම්රද අංකුර ලේඛකයින්ගේ 2023 පන්හිද පොත් දොරට වැඩුමේ සුභ මුහූර්තයට කැපවූ විද්‍යාලයීය ඇඳුරු මඩුල්ලේ දායකත්වය අවංකව අගය කරමින් සම්භාව්‍ය සාහිත්‍යධරයින් දම්රදය තුළින් තව තවත් බිහි වී දම්රද යශෝරාවය දස දෙස පතුරුවන්නට ශක්තිය ධෛර්යය ලැබේවායි මම ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

කමල් ආරියසිංහ,

විදුහල්පති,

ධර්මරාජ විද්‍යාලය,

මහනුවර.

# <u>ප්‍රාථමික අංශ භාර නියෝජ්‍ය විදුහල්පතිතුමියගේ</u>

# <u>සුභ පැතුම</u>



පොත පත පරිශීලනයට ඇති වූ කැමැත්ත මතින් පොත් ලිවීම දක්වා ඉදිරි පියවරක් තැබූ දම්රද කුඩා පුතුන්ට මාගේ සුභ පැතුම පිරි නමන අතර අනාගතයේ දී දක්ෂ ලේඛකයන් වීමට ශක්තිය ධෛර්යය ලැබේවා'යි කියා ප්‍රාර්ථනා කරමි.


රේණුකා ප්‍රේමතිලක,

නියෝජ්‍ය විදුහල්පතිනි,

ප්‍රාථමික අංශය,

ධර්මරාජ විද්‍යාලය,

මහනුවර.

# ලේඛක සංගමය භාර ආචාර්යතුමාගේ පණිවිඩය



21 වන සියවසේ උදාවත් සමඟ ගෝලීය ලොව තුළ, ලක් දෙරණ විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් සිටියි. එහි දී වත්මන් පාසල් පද්ධතිය තුළ ශිෂ්‍යයා නිරන්තරව දැනුම සොයන්නෙකු ලෙස ක්‍රියාකරමින් නිවැරදි දිශානතිය හඳුනා නොගෙන මං මුළා වී සිටියි.

වත්මන් පාසල් අධ්‍යාපනය තුළින් ස්වයං විනය ගිලිහී ගොස් ඇති අතර, පාසල් සිසුවා ලෞකික ද්‍රව්‍යමය දේ ළඟා කර ගැනීම සඳහා හුදු ආත්මාර්ථයෙන්, මෘදු කුසලතා යටපත් කර ගෙන යාන්ත්‍රිකව වනපොත් කරමින් ඉලක්ක ජය ගන්නට උත්සාහ කරයි.

මෙවැනි සමාජ වටපිටාවක් තුළ නිපුණතා පාදක දරු පිරිසක් දැයට දායාද කිරීමට නම් ඔවුන් තුළ සංවේදී මනසක්, දැතට හැකියාවක් පුරුදු පුහුණු කළ යුතුය. එහිදී ලේඛන කලාවට පැවරෙන්නේ සුවිශේෂී වගකීමක් හා වගවීමකි.

නිරන්තර සතතාභ්‍යාසයෙන්, විශේෂිත භාෂා ප්‍රාගුණ්‍යයෙන්, විචක්ෂණශීලී පුතෙකු දැයට දායාද කිරීමට දම්රද ලේඛක සමාජය සය වසරක් තුළ ගත් උත්සාහය අති උත්කෘෂ්ටය. මේ සඳහා අතීතයේ සිට නිවැරදි දිශානතිය පෙන්වූ සැම සිහි කරන්නේ හද පිරි ගෞරවයෙනි.

2023, සය වන පන්හිඳ පොත් දොරට වැඩුම ඔබ වෙත ගෙන එන්නේ “හෙළ අභිමන්” තේමා කර ගනිමිනි. එම අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් අංකුර ලේඛකයින් සමඟ අත්වැල් බැඳගෙන මෙම සුභ මුහුර්තයට නායකත්වය සැපයීමට ලැබීම මා ලද භාග්‍යයකි. මේ සඳහා නිබඳ දිරිය දෙමින් මග පෙන්වූ විදුහල්පතිතුමන් ඇතුළු දම්රද ඇදුරු මඬුල්ල හා අනධ්‍යන කාර්ය මණ්ඩලය, දම්රද පුතුණුවන් හා ඔවුන්ගේ දෙමාපියන්ගේ දායකත්වය අගය කරමින්, දම්රද කලාකාමී ලේඛකයන් දිනෙන් දින ලක් අඹරෙහි බැබළේවා’යි ඉත සිතින් පැතුමන් එක් කරමි.


ජනිත යූ.බී. සමරකෝන්,

ලේඛක සංගමය භාර ආචාර්ය,

ධර්මරාජ විද්‍යාලය,

මහනුවර.

"චලනිඳු ඔබ සූදානම් ද ?"

"ඔව්........ මම සූදානම් ...."

"එසඳු, ඩෙනුක ඔබලා සූදානම් ද ?"

"ඔව්........ අපි සූදානම් ...."

අභ්‍යවකාශ ගමනට සූදානම් වී

යානය තුළ අසුන්ගෙන සිටි අපට පාලන මධ්‍යස්ථානයෙන්

සංඥාව ලැබුණා.

දහය, නවය, අටයි, හතයි, හයයි, පහයි, හතරයි, තුනයි

දෙකයි, එකයි


බින්දුවයි...............


යානාව ක්‍රියාත්මක වී අප ඉහළ අහසට ඇදී යන

ආකාරය අපට දැනුණා.


හිස කැරකෙන්නට විය.

අපි ආසන දෑතින් තදින් අල්ලා ගත්තා.





යානාව ඉහළට යනවිට අපේ බිය අඩු වුණා.
ඇස් ඇර බලද්දී වලාකුළු අතරින් යානාව ඉදිරියට ම යන ආකාරය අප දුටුවා.
පුංචි කාලයේ  සිටම මම මැවූ සිහිනය සැබෑ වීම මහත් සතුටකි.
ගගනගාමියකු වීම මගේ සිහිනයයි.
ගගනගාමියකු ලෙස සැරසී  මම මෙම ගමනට එක් වූයේ මහත් ආඩම්බරයකිනි.



දින ගණනාවක් අපි රෑ දහවල් යානාව තුළ ගමන් කළා.
සඳ, තරු වලාකුළු අතරින් වේගවත් ව යන ගමන
විනෝද ජනක විය.
ආසන පටි ගැලවූ අපට දැනුණේ අලුත්ම අත් දැකීමකි.
යානාව තුළ අප පාවෙන්නට විය.



ප්‍රීතියෙන් කෑ ගසමින්  අප යානාව තුළ එහෙ මෙහෙ සැරිසැරුවා.

යානාව තුළ කෑම ගැනීම, නිදා ගැනීම, මුහුණ සේදීම අපට අලුත් අත්දැකීමක් විය.

මුල දී තරමක් අසීරු වුවත් ඒ සියල්ලටම අපි ඉක්මණින් හුරු විය.

බීමට ගත් ජලය බෝල ලෙස යානාව තුළ පාවෙන්නට විය.

අප ඒවා සමග විනෝද වුණා.




රාත්‍රියේ නිදා ගැනීම තරමක් අසීරු විය. අපට නිදා ගැනීමට
සිදු වූයේ  කුඩා කුටීර තුළ වූ නිදන බෑග තුළය.
රාත්‍රි ගමන ඉතාමත් විස්මය ජනක විය.
නිරීක්ෂණ කුටීර තුළට ගිය අපට
උල්කාපාත, වල්ගාතරු,  ග්‍රහලෝක ආදී බෝහෝ දේ
සියැසින්ම දැකීමට හැකි වුණා.
උල්කාපාත යානාව දෙසට ඇදී එනවාක් මෙන්
අපට දිස් වුණා.



මාස හතක පමණ අභ්‍යවකාශ චාරිකාවකින් පසු අප අඟහරු
වෙත ළඟා වුණා.
අපගේ ගමන සාර්ථක කරමින් යානාව අඟහරු වෙත
ගොඩබැස්වූවා.
මමත් එසඳුත් මුලින් ම යානාවේ දොරටුව වෙතට ගමන් කළා.
යානාවේ දොරටුව විවෘත කිරීමත් සමග දුටු දර්ශනයෙන් අප
පුදුමයට පත් වුණා.
යානාව වට කර අගුටුමිට්ටන් රාශියක් සිටිනවා අප දුටුවා.
ඔවුන් අප දෙස බලා සිටි ආකාරය ඉතාමත් බියකරුය.





යානාවෙන් බිමට බසින ලෙස ඔවුන් අපට සංඥා කළා. අපගේ බිය තවත් වැඩි වුණා. ඔවුන් වටා කුඩා නිවාසවලින් සෑදුණු  ජනාවාස රාශියක් ද අප ඒ අතර දුටුවා .

අඟහරු තුළ ජීවීන් නොමැති බව දැන සිටි අප මෙම දර්ශනයෙන් භීතියට පත් වුණා. ඊළඟට කුමක් කරන්නේ දැයි කල්පනා කළ මම එක්වරම එසඳුගේ අතින් අල්ලාගෙන නැවත යානය තුළට දුව ගොස් යානයේ දොර වසා දැමුවා.



එසැණින් ඩෙනුකට යානාව පණගන්වන ලෙස මම කෑ ගැසුවා.

ඔහු ඉක්මණින් යානාව ක්‍රියාත්මක කළා.

අප නැවතත්  පෘථිවිය දෙසට ගමන ආරම්භ කළා.

ඒ සමඟම යානාව ඉදිරියට විශාල ගිනිබෝලයක් මෙන්

උල්කාපාතයක් එන  ආකාරය මම දුටුවා.

මම මහ හඬින් කෑ ගසන්නට තැත් කළා.

එත් සමඟම අම්මා මට

පුතේ..... පුතේ...... කියමින් අවදි කළා.

# ස්තූතිය

මෙම පොත සෑදීමට
නන් අයුරින් උදවු උපකාර කළ
සැමට තුති.